# ගජකුම්භ ජාතකය

තවද ධර්මරාජානන් වූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කුසීත භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ කළමනා පිළිවෙත්හි ද උගතමනා ධර්මයන් නොයිගැන්මෙන් කුසිත භාවය කරණ සේක. එපවත් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒ කෙසේ දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවෝ සියලු කටයුත්තෙහි කුසීතව වාසය කරන්නාහ. බෝධි සත්වයෝ කුසිතභාවය අරවාපියම්දෝහෝයි සිතා උන් කලට එක් දවසක් රජ්ජුරුවෝ මගුල් උයනට ක්‍රීඩාවටයයි ගියාහ. ඒ උයනේ ගජකුම්භයෝ යයි යන තිරිසනෙකු යන්නාවූ රජ්ජුරුවෝ දැක බෝධිසත්වයන් අතින් මේ කුමන තිරිසනෙක්දැයි විචාළ හ. බෝධිසත්වයෝ ස්වාමිනි මේ ගජකුම්භයෝයයි යන තිරිසනකැයි කියා බෝධිසත්වයෝ ගජකුම්භයා හා කැටිව කථාකරන්නේ එම්බල ගජකුම්භය. තාගේ ගමන් දාවල්තිස්සේ පලායෙයි නම් අඟලක් හෝ දෑගලක් හෝ පලායන්නෙහිය. ඉදින් ලැවු ගින්නෙක් වැදගත් නම් කෙසේ ගැලවීයෙයි දැයි බෝධිසත්වයෝ ගජකුම්භයා අතින් විචාළාහ. ගජකුම්භයා කියන්නේ ගස් බිලයකට හෝ පොළවට හෝ වැදයෙමි. ඉදින් එසේවූ දෙයක් නොලදීන් නම් මාගේ ජාතිකර්මයයි කීහ. එවිට බෝධි සත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු ස්වාමිනි මේ ගජකුම්භා තමාගේ කුසීත භාවයෙන් යම් දුක්ඛය කට පැමිණෙද එමෙන් තපස්වීවරුන් වහන්සේ ද රජ්ජුරුවන් වහන්සේද ගිහි දනද තම තමන් කළමනා ඒ ඒ කටයුත්තෙහි ප්‍රමාදවෙත් නම් පසඳහායන පක්ෂයෙහි චන්ද්‍රයාමෙන් හායනයට යන්නාහ. යම් තපස්වී කෙණෙක් තමන් කළ මනා වත් පිළිවෙත් ආදීවූ දෙය වේලා නොවරදවා විචාරත් නම් එසේ වූ සත්වයන්ට අවවාද කෙරෙද්ද යම් රජ්ජුරුකෙණෙක් තමන්ගේ රාජ්‍යයේ කළමනා කටයුතු කාර්ය ඒ ඒ කාර්ය වෙලෙහි විචාරා කියන්ද යම් ගිහි කෙණෙක් තමන්ගේ කල්පනා ගොයිතැන් ආදීවූ සියලු කටයුතු වෙලා නොවරදවා විචාරත් නම් එසේ වූ සත්වයන්ට සියලු ඓශ්වර්ය කලාවෙන් කලාවට වඩනා පූර්ණ චන්ද්‍රයාමෙන් වඩනේයයි කිහ. මේ කියේ මට යයි රජ්ජුරුවෝ දැන එතැන් පටන් කුසිත භාවය හැර රජ්ජය කළහයි වදාරා මේ ගජකුම්භ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂූහුය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම් ම යයි වදාළසේක.